# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2208/33 - 2020 දෙසැම්බර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2020.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. ලලිත් වීරතුංග මැතිතුමා
   ජනාධිපති ප්‍රධාන උපදේශක
2. මේජර් ජෙනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මැතිතුමා
   ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
3. වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මැතිතුමා
   ලේකම්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
4. කේ. ආර්. උඩුවාවල මැතිතුමා
   ලේකම්, ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය
5. ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   යුධ හමුදාපති / කොවිඩ් - 19 කාර්ය සාධක බලකායේ ප්‍රධානී
6. වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මැතිතුමා
   සභාපති, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
7. වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මැතිතුමා
   ළමා ස්නායු රෝග විශේෂඥ / සභාපති, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
8. වෛද්‍ය අසේල ගුණවර්ධන මැතිතුමා
   සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්


1A - G 33462 — 380 (2021/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2020 වර්ෂයේ මාර්තු මාසයේ දී වසංගතයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද කොවිඩ් - 19, ජාතික සෞඛ්‍ය පද්ධතීන් කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරමින් සහ පුරවැසියන්ගේ ආර්ථික හා සමාජයීය ප්‍රගතියට බාධා එල්ලවන පරිදි පැතිරී යන බැවින් ද,

2020 වර්ෂයේ දෙසැම්බර් මස 28 වන දින වනවිට කොවිඩ් - 19 රෝගීන් ලෙස හඳුනාගන්නා ලද සංඛ්‍යාව 41,054 ක් සහ සිදුවී ඇති මරණ සංඛ්‍යාව 194 ක් වන බැවින් ද,

ආරක්ෂිත සහ කාර්යක්ෂම එන්නතක් මගින් ජනගහන ප්‍රතිශක්තිකරණය ඇති කිරීම, ප්‍රතිශක්තිය ඉහළ නැංවීමට සහ රෝගය පැතිරීම පාලනය කිරීමට හේතුවන වඩාත්ම ප්‍රතිඵලදායී සහ කල්පවත්නා ක්‍රමවේදය වන බැවින් ද,

කොවිඩ් - 19 සඳහා ජනගහන ප්‍රතිශක්තිය ලඟා කරගැනීම සඳහා එවැනි එන්නතක්, නියමිත කාලසීමාව තුළ, කාර්යක්ෂමව ලබාදීම වර්තමානයේ රට මුහුණ දෙන ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන බැවින් ද,

එන්නත්කරණ සැලැස්ම ප්‍රතිඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය ආයතන සහ පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණයෙන් ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා ඉහළ මට්ටමේ ජාතික මැදිහත්වීමක් අවශ්‍යවන බැවින් ද,

ප්‍රසම්පාදන ප්‍රභවයන් සහ පටිපාටීන් සම්බන්ධයෙන් වූ අධිකාරිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරී ඇති බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. ලලිත් වීරතුංග මැතිතුමා
   ජනාධිපති ප්‍රධාන උපදේශක
2. මේජර් ජෙනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මැතිතුමා
   ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
3. වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මැතිතුමා
   ලේකම්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
4. කේ.ආර්. උඩුවාවල මැතිතුමා
   ලේකම්, ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය
5. ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   යුධ හමුදාපති / කොවිඩ් - 19 කාර්ය සාධක බලකායේ ප්‍රධානී
6. වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මැතිතුමා
   සභාපති, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
7. වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මැතිතුමා
   ළමා ස්නායු රෝග විශේෂඥ / සභාපති, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
8. වෛද්‍ය අසේල ගුණවර්ධන මැතිතුමා
   සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

(අ) තාක්ෂණික විශේෂඥයන් සමග සාකච්ඡා කිරීමෙන් සහ පවත්නා සාක්ෂි මත පදනම්ව ශ්‍රී ලංකාව සඳහා වඩාත් සුදුසු ආරක්ෂිත සහ කාර්යක්ෂම කොවිඩ් - 19 එන්නතක් හඳුනා ගැනීම.

(ආ) කොවිඩ් - 19 එන්නත නියමිත කාලයට ලබාදීමේ දී හදිසි අනුමත කිරීම්, කඩිනම් ප්‍රසම්පාදනය, ආනයනය, රේගු නිදහස් කිරීම් හා ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා නිකුත් කිරීම් කිරීමේ දී සුදුසු හා විධිමත් නියාමන හා පරිපාලන පටිපාටි ස්ථාපිත කිරීම.

(ඇ) තාක්ෂණික හා ද්‍රව්‍යමය සහාය සඳහා අදාළ තානාපති කාර්යාල, ආධාර ලබා දෙන ආයතන, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ වෘත්තිකයින් සමග එක්ව කටයුතු කිරීම.

(ඈ) එන්නත්කරණ පළමු අදියර සඳහා කොවිඩ් - 19 වැළඳීමට ඉහළ අවදානමක් සහිත ජන කණ්ඩායම් හඳුනාගෙන ප්‍රමුඛතාවය ලබා දීම සහ ඉන්පසු අනුක්‍රමිකව සාමාන්‍ය ජනතාවට ලබා දීම සඳහා සැලසුම් කිරීම.

(ඉ) පැහැදිලි වගකීම්, සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සහ සහභාගී වන පාර්ශවකරුවන් සඳහා කාල රාමු සහ වාර්තාකරන ක්‍රියා පිළිවෙලවල් සහ කළමනාකරණ ව්‍යුහයන් ද ඇතුළත් කොවිඩ් - 19 එන්නත බෙදා හැරීම සහ එන්නත්කරණ සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඊ) එන්නත් ගබඩා කිරීම, බෙදා හැරීම, උෂ්ණත්ව නියාමනය හා අධීක්ෂණය සහ එන්නත් තොග ප්‍රමාණ වාර්තා කිරීම පිණිස වර්තමානයේ පවතින ක්‍රමවේදයන්හි අඩුපාඩු හඳුනා ගැනීම හා ඒ සඳහා පිළියම් යෙදීම පිණිස පවතින සැපයුම්දාම විශ්ලේෂණය කිරීම.

(උ) එන්නත් භාවිතය අධීක්ෂණය හා වාර්තා කිරීම ද ඇතුළත්ව එන්නත් තොග කළමණාකරණය සහ බෙදා හැරීම් සඳහාවන ශක්තිමත් සැපයුම්දාම තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.

(ඌ) එන්නත්කරණය සඳහා ස්ථාන සහ එන්නත්කරණ කණ්ඩායම් හඳුනා ගැනීම, වෛද්‍ය උපකරණ සහ පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම සහ බෙදා හැරීම, ශීත තත්ත්වදාම ධාරිතාව සහ එන්නත් ගබඩා කිරීම යනාදී කටයුතු ඇතුළත් එන්නත්කරණ සැලසුම ක්‍රියාවට නැංවීම සඳහා සුදුසු සැපයුම් සේවා සැලැස්මක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

(එ) එන්නත් බෙදා හැරීම හා එන්නත්කරණය නියමිත කාලයට සිදුකිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍යවන මානව සම්පත, තාක්ෂණය හා මූල්‍ය ප්‍රතිපාදන හඳුනා ගැනීම.

(ඒ) කොවිඩ් - 19 එන්නත් පිළිබඳව ගෝලීය තොරතුරු අඛණ්ඩව සමාලෝචනය කිරීම හා එම තොරතුරු සුදුසු ලෙස, කොවිඩ් - 19 එන්නත් බෙදා හැරීම හා එන්නත්කරණ ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී හා සකස් කිරීමේ දී භාවිතා කිරීම.

(ඔ) එන්නත්කරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ අහිතකර සිද්ධීන් ක්ෂණිකව වාර්තා කිරීම සඳහා එන්නත් සුපරීක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

(ඕ) එන්නත් බෙදා හැරීම සහ එන්නත්කරණය සාර්ථකව සහ නියමිත කාල රාමුව තුළ සිදු කිරීම සඳහා සැපයුම්දාම හා සෞඛ්‍ය කාර්යය මණ්ඩල විධිමත් ලෙස පුහුණු කිරීම තහවුරු කිරීම සහ එම පුහුණුවෙහි ගුණාත්මක බව තහවුරු කිරීම පිණිස අදාළ විශේෂඥයින් හා ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීම.

(ක) එන්නත් බෙදා හැරීම හා එන්නත්කරණයේ ප්‍රගතිය පිළිබඳව වාර්තා කිරීමට පොදු සන්නිවේදන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

තව ද, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මැතිතුමා කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන කාර්යසාධක බලකායේ සභාපති ලෙසත්,

ජනාධිපති අතිරේක ලේකම් චන්දිමා වික්‍රමසිංහ මෙනවිය ලේකම් ලෙසත්, පත් කරමි.

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටු කරලීමට අදාළව අවශ්‍ය පරිදි උපදෙස් නිකුත් කිරීමට, කරුණු සොයා බැලීමට සහ පරීක්ෂා කිරීමට කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහාවන ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත්කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයි ද, ලබාදිය යුතු සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තව ද, කිසියම් රාජ්‍ය සේවකයකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියකු විසින් කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහාවන ජනාධිපති කාර්ය සාධක

බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙර කී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

තව ද, කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහාවන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබ කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ දෙසැම්බර් මස 28 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.